**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

## අදියර III විභාගය - ජනවාරි 2023

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

---

(303) මූල්‍ය පාලනයන් සහ විගණනය ප්‍රශ්න පත්‍රය අනිවාර්ය ප්‍රශ්න 9 කින් සමන්විත වේ. ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත විය. එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 ක් **A කොටසට** අඩංගු විය. එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 ක් **B කොටසට** අඩංගු විය. **C කොටසට** එකකට ලකුණු 25 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න 2ක් අඩංගු විය.

අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයා තිබුනි. කෙසේ වෙතත් ප්‍රශ්න වල සමහර කොටස් සඳහා උත්තර සපයා නොතිබුනි. ඊට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ දුර්වල කාල කළමනාකරණය, දැනුම නොමැති වීම, සහ ප්‍රශ්නයෙන් අවශ්‍ය කර තිබූ දේ අවබෝධ කර නොගැනීම වැනි කරුණුය.

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** ලේකම්වරයා විසින් සිදු කර ඇති ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද යන්න පැහැදිලි කිරීම කළ යුතුව තිබුනි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් වරදවා ඔවුන් මෙකී ප්‍රකාශය සමඟ එකඟ නොවන බව දක්වා තිබීම හේතුවෙන් අඩු ලකුණු ලබා ගෙන තිබුනි. මෙයින් තහවුරු වන්නේ හිමිකාරීත්ව න්‍යාය සහ නියෝජ්‍යාත්ව න්‍යාය පිළිබඳව අයදුම්කරුවන් හට ප්‍රමාණවත් දැනුමක් නොමැති බවය.

ස්ව-අධ්‍යයන පාඩම් මාලාවේ (study text) පැහැදිලිව සඳහන් කර ඇත්තේ,

- අධ්‍යක්ෂකවරුන් සමාගමක භාරකරුවන්ය
- කොටස් හිමියන් යනු ඔවුන් වෙනුවෙන් සමාගම පවත්වාගෙන යාම සඳහා නියෝජිතයින් ලෙස අධ්‍යක්ෂකවරුන් සේවයේ යොදවන ප්‍රධානින්ය.

එබැවින්, එම ස්ව-අධ්‍යයන පාඩම් මාලාවෙහි අන්තර්ගතය කෙරෙහි අයදුම්කරුවන් විසින් ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතු වේ.

ප්‍රශ්නයේ **(b) කොටස** "විශ්වාසනීය සම්බන්ධතාවය" යන යෙදුම පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටියේය.

කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි. ස්ව-අධ්‍යයන පාඩම් මාලාවේ පැහැදිලිව සඳහන් කර ඇත්තේ එක් පුද්ගලයෙකුට තවත් කෙනෙකු කෙරෙහි සැලකිල්ලෙන් කටයුතු කිරීමේ වගකීමක් ඇති විට එය විශ්වාසනීය සම්බන්ධතාවයක් ලෙස දැක්විය හැකි බවයි.

පහත සඳහන් කරුණු පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා ගැනීමට අයදුම්කරුවන් හට උපදෙස් දෙනු ලැබේ:

- නියෝජ්‍යත්ව න්‍යාය
- භාරකාරීත්ව න්‍යාය
- විශ්වාසනීය සම්බන්ධතාවය
- නියෝජ්‍යත්ව ගැටුම්
- අධ්‍යක්ෂකවරුන්ගේ මූලික භාරකාර කාර්යභාරය තහවුරු කිරීම සඳහා විගණනය තුලින් යාන්ත්‍රණයක් සපයන්නේ කෙසේද?

## ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නයෙන් සමාගම මුහුණ දී ඇති විවිධ අවදානම් වර්ග හඳුනා ගැනීමත්, හඳුනාගත් එක් එක් අවදානම සඳහා වඩාත් සුදුසු අවදානම් අවමකිරීමේ පියවරයන් හඳුනා ගැනීමත් අවශ්‍ය විය.

බොහෝ අයදුම්කරුවන් අවදානම් වර්ග හඳුනාගෙන තිබූ නමුත් සුදුසු අවදානම් අවම කිරීමේ ක්‍රම සඳහන් කිරීමට නොහැකි විය. තවද සමාගමේ දෘෂ්ටිකෝණය මත පදනම්ව ව්‍යාපාරයේ ස්වභාවය තේරුම් ගනිමින් පිළිතුර සැපයීම මෙවන් ප්‍රශ්නයකින් අපේක්ෂා කෙරේ.

අයදුම්කරුවන් විසින් සපයන ලද අදාළ නොවන පිළිතුරු කිහිපයක් පහත පරිදි වේ:

- සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම - මූල්‍ය අවදානම
- පාරිභෝගිකන් විසින් භාණ්ඩ ප්‍රතික්ෂේප කිරීම - මෙහෙයුම් අවදානම
- පොලී අනුපාත ඉහළ යාම - මූල්‍ය අවදානම

පහත සඳහන් අංශ පිළිබඳ අයදුම්කරුවන් විසින් වැඩි අවධානයක් යොමු කළ යුතු වේ:

- ආයතනයේ බාහිර හා අභ්‍යන්තර අවදානම
- අවදානම් කළමනාකරණ රාමුව
- අවදානම අවම කිරීම සඳහා භාවිතා කරන ශිල්පීය ක්‍රම
- අවදානම් කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතිනි.

බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයේ අවශ්‍යතාවය පැහැදිලිව වටහාගෙන තිබුණේ නැත.

ප්‍රශ්නයේ අවශ්‍යතා දෙකක් තිබුණිඃ

- සහතික වීමේ කාර්යභාරයක අංගයක් ලෙස පාර්ශව තුනේ කාර්යභාරය පැහැදිලි කිරීම.

- එම පාර්ශවයන් එකිනෙකට සම්බන්ධ වන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීම.

අයදුම්කරුවන් ප්‍රශ්නයේ නිශ්චිත අවශ්‍යතාවය තේරුම් නොගෙන පාර්ශව තුනක සම්බන්ධතාවය ගැන දන්නා සියලු දේ ලියා තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සහතික කිරීමේ පාර්ශව තුන හඳුනාගෙන ඇතත්, ඔවුන් එකිනෙකා සමඟ සම්බන්ධ වන්නේ කෙසේදැයි පැහැදිලි කර තිබුනේ නැත.

එබැවින්, අයදුම්කරුවන්ට ප්‍රශ්නයේ අවශ්‍යතාවය නිසි ලෙස අවබෝධ කර ගැනීමට සහ පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ විෂය දැනුම වැඩි දියුණු කිරීමට උපදෙස් දෙනු ලැබේඃ

- සහතික වීමේ කාර්යභාරය සහ සාධාරණ සහතික වීම සහ සීමිත සහතික වීම අතර වෙනස
- සහතික වීමේ කාර්යභාරයක ප්‍රධාන අංග
- සහතික වීමේ කාර්යභාරයක් භාර ගැනීමේදී සහ කළමනාකරණය කිරීමේදී සම්පූර්ණ කළ යුතු කරුණු
- අදාල සේවාවන්

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය පදනම් වී ඇත්තේ ආයතන මට්ටමින් සහ තනි තනි විගණන මට්ටමින් තත්ත්ව පාලනය මත ය.

කාර්යසාධනය ඉතා දුර්වල මට්ටමක පැවතිනි.

බොහෝ අයදුම්කරුවන්ට ආයතන මට්ටමින් සහ තනි තනි විගණන මට්ටමින් පැවතිය යුතු තත්ත්ව පාලන ක්‍රමවේදය පිළිබඳ අවබෝධයක් නොතිබුණි. නායකත්ව වගකීම සහ අධීක්ෂණය පිළිබඳ සාමාන්‍ය දැනුම උපයෝගී කර ගනිමින් ඔවුන් පිළිතුරු ලබා දී තිබුණේ ප්‍රශ්නයේ අවශ්‍යතාවය තේරුම් නොගෙනය.

මෙය ස්ව-අධ්‍යයන පාඩම් මාලාවෙහිද අන්තර්ගත වේ.

නායකත්ව වගකීම් සඳහා, අයදුම්කරුවන් විසින් පහත සඳහන් අදාළ නොවන පිළිතුරු සඳහන් කර තිබුණිඃ

- අධීක්ෂණය
- පාලනය
- සන්නිවේදනය
- අභිප්‍රේරණය යනාදිය

පහත කරුණු පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම වැඩි දියුණු කර ගත යුතුය:

- තත්ත්ව පාලන පද්ධතියේ අරමුණ
- තත්ත්ව පාලන පද්ධතියේ අංග
- මූල්‍ය ප්‍රකාශන විගණනයේදී අදාල වන  තත්ත්ව පාලන අවශ්‍යතා
- සේවාලාභියාගේ සම්බන්ධතාවය සහ විගණන කටයුතු පිළිගැනීම සහ අඛණ්ඩව පැවැත්ම.

## B කොටස

### ප්‍රශ්න අංක 05

ප්‍රශ්නයේ **(a) කොටසින්** විගණනයක් ප්‍රමාණවත් ලෙස සැලසුම් කිරීමෙන් විගණකයෙකු ලබා ගන්නා ප්‍රතිලාභ තුනක් හඳුනා ගැනීමට අවශ්‍ය විය.

සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුනි.

සමහර අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන සාමාන්‍ය පිළිතුරු සපයා තිබුණි:

- විගණනයේ කාර්යක්ෂමතාව සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම
- පිරිවැය පාලනය
- සේවාලාභී ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම

**(b) කොටස** මගින් විගණකවරයා විසින් **ස්ටාර් ලංකා (පුද්) සමාගම** පිළිබඳ අවබෝධයක් ලබාගත යුතු ක්ෂේත්‍ර තුනක් සඳහන් කළ යුතු විය.

මෙය පහසු ප්‍රශ්නයක් වූ අතර ස්ව-අධ්‍යයන පාඩම් මාලාවෙහි ද විගණකයා විසින් සේවාලාභියාගේ ආයතනය පිළිබඳ අවබෝධයක් ලබා ගත යුතු බොහෝ ක්ෂේත්‍ර සඳහන් කර ඇත.

මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතිනි.

පහත සඳහන් පරිදි අදාළ නොවන පිළිතුරු කිහිපයක් තිබුණි:

- ගෙවීම් ක්‍රියාවලිය.
- බෙදා හැරීමේ ක්‍රියාවලිය.
- තොග වාර්තාව.
- බැංකු ප්‍රකාශන.

**(c) කොටසින්** වර්තමාන විගණන කටයුතු ආරම්භයේදී විගණකවරයා විසින් සිදු කළ යුතු මූලික කටයුතු පැහැදිලි කිරීමට දක්වා තිබුනි.

කාර්යසාධනය ඉතා දුර්වල මට්ටමක පැවතිනි.

අයදුම්කරුවන් ප්‍රශ්නයේ අවශ්‍යතාව තේරුම් ගෙන නොතිබූ අතර පහත සඳහන් අදාළ නොවන පිළිතුරු සපයා තිබුණි,

- පෙර විගණන ගොනු සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර පාලන පරීක්ෂා සිදු කිරීම.
- අදාළ පාර්ශව ගනුදෙනු පරීක්ෂා කිරීම.

ඔවුන්ට 'වර්තමාන විගණන කාර්යභාරය ආරම්භයේ මූලික කටයුතු' යන වචනය මග හැරී තිබුනි.

## ප්‍රශ්න අංක 06

**(a) කොටස** මගින් ආයතනයක වංචා වැළැක්වීම සහ හඳුනා ගැනීම සඳහා විගණකයාගේ වගකීම පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය කර තිබුනි.

බොහෝ අයදුම්කරුවන් හට පහත සඳහන් වැදගත් කරුණු මග හැරී තිබුණිඃ

- වංචා වැළැක්වීම සහ හඳුනා ගැනීම සඳහා මූලික වගකීම පාලනය සඳහා වග කිව යුතු පාර්ශවයන්ට පැවරේ.
- විගණනයේ ආවේණික සීමාවන් හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල යම් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හඳුනා නොගැනීම නොවැළැක්විය හැකිය.

බොහෝ අයදුම්කරුවන් ප්‍රකාශ කර තිබුණේ වංචා වැළැක්වීම සහ හඳුනා ගැනීම විගණකයාගේ වගකීම බවයි.

කාර්යසාධනය සාමාන්‍ය මට්ටමට වඩා අඩු මට්ටමක පැවතුනි.

**(b) කොටසින්** විගණන අවදානම සහ වංචා අවම කිරීම සඳහා විගණකවරයා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි හඳුනා ගැනීම අපේක්ෂා කර තිබුනි.

කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුනි.

කෙසේවෙතත්, අයදුම්කරුවන් සැළකිය යුතු සංඛ්‍යාවක් සාමාන්‍ය විගණන ක්‍රියා පටිපාටි සඳහන් කර තිබුණි,

- පරීක්ෂා කිරීම, නිරීක්ෂණය කිරීම, විමර්ශනය කිරීම යනාදිය.

සමහරු සම්පූර්ණයෙන්ම අදාළ නොවන පිළිතුරු සපයා තිබුණිඃ

- CCTV ස්ථාපනය
- ආරක්ෂක භටයන්

මෙම කොටස සඳහා වෙන් කර ඇති සම්පූර්ණ ලකුණු ලබා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියා පටිපාටි සඳහන් කළ යුතු විය.

- වංචාවන් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ ඇතුලත් කිරීමේ අවදානම හඳුනා ගැනීම.
- තක්සේරු කරන ලද අවදානම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම.
- විගණනයේදී හඳුනාගත් වංචා හෝ සැක සහිත වංචා වලට නිසි ප්‍රතිචාර දැක්වීම.

**(c) කොටස** විගණනය සිදු කිරීමේදී පාලනය සඳහා වග කිව යුතු පාර්ශවයන් සමඟ සන්නිවේදනය කළ යුතු ක්ෂේත්‍ර පැහැදිලි කිරීම අවශ්‍ය විය.

කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි. මෙම කොටස සඳහා පිළිතුරු ස්ව-අධ්‍යයන පාඩම් මාලාවේ පැහැදිලිව දක්වා ඇත.

පහත සඳහන් අදාළ නොවන පිළිතුරු මෙම ප්‍රශ්නය සඳහා සපයා තිබුනිඃ

- ආයතනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- මූල්‍ය වාර්තාකරණ රාමුව.
- ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි.
- ගිණුම්කරණ ප්‍රමිතීන්.

## ප්‍රශ්න අංක 07

**Relaiable PLC** හි විගණන කාර්යභාරය පිළිගැනීමේ දී සලකා බැලිය යුතු සහ කාර්යභාර හවුල්කරුට සන්නිවේදනය කළ යුතු කරුණු සාකච්ඡා කිරීම (a) කොටසින් අවශ්‍ය කෙරිණි.

මෙය ඉතා පහසු ප්‍රශ්නයක් වූයේ එකී සලකා බැලිය යුතු හා සන්නිවේදනය කළ යුතු කරුණු ප්‍රශ්නය තුලම ඇතුළත් වූ බැවිනි.

කෙසේ වෙතත්, කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි. අවශ්‍යතාවය තේරුම් නොගැනීම සහ නිසි අවධානයෙන් ප්‍රශ්නය නොකියවීම මෙයට ප්‍රධාන හේතුව විය හැකිය.

අයදුම්කරුවන් ප්‍රශ්නය හොඳින් කියවා තිබුණා නම් වැඩි උත්සාහයකින් තොරව සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිව තිබුණි.

ඇතැම් අයදුම්කරුවන් අදාළ නොවන පිළිතුරු සපයා තිබුනිඃ

- සදාචාරාත්මක අවශ්‍යතා.
- විගණනය සැලසුම් කිරීම සහ සිදු කිරීම.
- විගණන ලියකියවිලි.

**(b) කොටස** මගින් නව විගණන සේවලාභියෙකු පිළිගැනීමේදී විගණකගේ වෘත්තීය නිපුණතාවයට සහ නිසි සැලකිල්ලට එල්ල විය හැකි තර්ජන සහ ඒ සඳහා විගණකට ගත හැකි ආරක්ෂක ක්‍රම පැහැදිලි කිරීම අවශ්‍ය විය.

ඍජු පිළිතුරු ලබා දිය හැකිව තිබූ අතර ඒවා ස්ව-අධ්‍යයන පාඩම් මාලාවෙහි ද පැහැදිලිව දක්වා ඇත.

කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි,

පහත දැක්වෙන අදාළ නොවන පිළිතුරු විය:

- පසුගිය වසරේ විගණන වාර්තා සමාලෝචනය කිරීම.
- කළමනාකාරිත්වය සමග සාකච්ඡා කිරීම.
- කළමනාකරණ නියෝජනය ලබා ගැනීම.

## <u>C කොටස</u>

## ප්‍රශ්න අංක 08

**(a)** මෙම කොටස යටතේ **ඔසු මැදුර (පුද්) සමාගමේ** අභ්‍යන්තර පාලන දුර්වලතා හතරක් හඳුනා ගැනීමට අවශ්‍යය. පිළිතුර පහසුවෙන් ම ප්‍රශ්නය තුලින්ම හඳුනා ගත හැකිය. සියලුම අයදුම්කරුවන් පාහේ මෙම කොටස උත්සාහ කර ඇති අතර අයදුම්කරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් වෙන් කරන ලද ලකුණු වලින් ලකුණු 02 කට වඩා ලබා ගත්හ. ස්ව-අධ්‍යයන පාඩම් මාලාවෙහි විශාලත්වය හා මෙහෙයුම් ස්වභාවය නොසලකා ආයතනයක් තුල සාමාන්‍යයෙන් තිබිය යුතු අභ්‍යන්තර පාලනයන් පැහැදිලිව සඳහන් වී ඇත.

පහත දැක්වෙන අභ්‍යන්තර පාලන දුර්වලතා ලබා දී ඇති තොරතුරු වලින් පහසුවෙන් හඳුනා ගත හැකිව තිබුණි:

(1) වෛද්‍ය වෘත්තිකයෙකු වන **වෛද්‍ය රොෂාන්** ගණකාධිකාරීවරයෙකුගේ කාර්යයන් ඉටු කරයි.

(2) ගිණුම්කරණ කාර්යයන් ඉටු කරන ඖෂධවේදිනියක් වන කල්පනී.

(3) **වෛද්‍ය රොෂාන්** පරිගණක පද්ධතියේ සඳහන් ශේෂයන් මත පදනම්ව ඖෂධ නිෂ්පාදිත සඳහා ඇණවුම් කරයි.

(4) මිලදී ගැනීම් සඳහා ගෙවීම්, මිලදී ගැනීමේ ඇණවුම සහ GRN සමග පරීක්ෂා නොකර සැපයුම්කරුවන්ගේ ඉන්වොයිසි මත පදනම්ව සිදු කරනු ලැබේ.

(5) ප්‍රායෝගිකව CDM යන්ත්‍රය මගින් තැන්පත් කළ හැක්කේ මුදල් නෝට්ටු පමණි. එයින් අදහස් වන්නේ වෙනම ලාච්චුවක තබා ඇති කාසි බැංකුගත කර නොමැති අතර එය 'සියලු ආදායම් වහාම බැංකුගත කළ යුතුය' යන මූලධර්මය උල්ලංඝනය කරන බවයි.

සමහර අයදුම්කරුවන් අදාළ නොවන සහ පොදු පිළිතුරු ලබා දී තිබුණි:

- ණයට විකුණුම් සිදු නොකිරීම.
- මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවක් නොමැති වීම.
- මිලදී ගැනීම් සහ ගෙවීම් මෙහෙයවනු ලබන්නේ මහරගම ශාඛාවෙන් පමණක් වීම.

**(b)** මෙම කොටසින් අයදුම්කරුවන්ගෙන් 'අභ්‍යන්තර පාලන ක්‍රමය' යන්නෙහි අර්ථය පැහැදිලි කිරීම අපේක්ෂා විය. කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවති අතර බොහෝ අයදුම්කරුවන් සාමාන්‍ය පිළිතුරු ලබා දී ඇති අතර ඔවුන්ගේම වචන වලින් පැහැදිලි කර ඇත. AAT විෂය මාලාවේ, 25% ක බරතැබීමක් අභ්‍යන්තර පාලන පද්ධතිය සහ ව්‍යාපාර ක්‍රියාවලීන් සඳහා වෙන් කර ඇත. ඇතැම් අයදුම්කරුවන් අභ්‍යන්තර පාලන පද්ධතියේ අර්ථය දැන සිටියේ නැත. 'අභ්‍යන්තර පාලන පද්ධතියේ' නිර්වචනය ස්ව-අධ්‍යයන පාඩම් මාලාවේ පැහැදිලිව දක්වා ඇත.

එබැවින් අදාළ පොත්පත් නිසි පරිදි අධ්‍යනය කරන ලෙස අයදුම්කරුවන් හට උපදෙස් දෙනු ලැබේ.

**(c)** මෙම කොටසින් පාලන පරිසරයේ අංග පහක් ප්‍රකාශ කිරීමට දක්වා තිබුණි. කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවති අතර බොහෝ අයදුම්කරුවන් COSO අනුව අභ්‍යන්තර පාලන පද්ධතියේ සංරචක සමඟ ව්‍යාකූල වී ඇත. COSO අනුව පාලන පරිසරය පාලන පද්ධතියේ එක් අංගයක් පමණි.

අයදුම්කරුවන් විසින් සපයන ලද අදාළ නොවන පිළිතුරු කිහිපයක් පහත දැක්වේ:

- සේවකයින් පාලනය කිරීම.
- ආයතනික පාලනය.
- ව්‍යාපාර ක්‍රියාවලිය සහ ක්‍රියා පටිපාටි.

**(d)** මෙම කොටස මගින් **ඔසු මැදුර (පුද්) සමාගමෙහි** ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාවලීන් තුනක් පැහැදිලි කරන ලෙස දක්වා තිබුනි. අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නය උත්සාහ කළ අතර කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුනි. බොහෝ අයදුම්කරුවන් පැහැදිලි කිරීමකින් තොරව ව්‍යාපාර ක්‍රියාවලීන් ගැන සඳහන් කර ඇති අතර අඩු ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය පහසු වුවද සමහරු මාතෘකාවේ මූලික කරුණු නොදනිති.

ඇතැම් අයදුම්කරුවන් පහත සඳහන් අදාළ නොවන පිළිතුරු සපයා තිබුණි:

- නිෂ්පාදන ක්‍රියාවලිය.
- විකුණුම් සහ අලෙවිකරණ ක්‍රියාවලිය.
- පරිපාලන ක්‍රියාවලිය.

**(e)** මෙම කොටසින් ඔසු මැදුරට සලකා බැලිය හැකි උදාහරණයක් බැගින් යෙදුම් පාලන තුනක් හඳුනා ගන්නා ලෙස දක්වා තිබුනි. අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නය උත්සාහ නොකළ අතර කාර්ය සාධනය ඉතා දුර්වල මට්ටමක පැවතුනි. එක් එක් පාලනය සඳහා වලංගු උදාහරණයක් සඳහන් කර තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකි. පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමට අයදුම්කරුවන් හට උපදෙස් දෙනු ලැබේ.

පහත සඳහන් කරුණු ස්ව-අධ්‍යයන පාඩම් මාලාවේ පැහැදිලිව සඳහන් කර ඇත.

- පරිගණකගත පද්ධති භාවිතය හා සම්බන්ධ අවදානම්.
- උදාහරණ සහිත තොරතුරු තාක්ෂණ සාමාන්‍ය පාලනයන්.
- උදාහරණ සමග තොරතුරු තාක්ෂණ යෙදුම් පාලනයන්.
- තොරතුරු තාක්ෂණ පාලනයේ වැදගත්කම.

## ප්‍රශ්න අංක 09

**(a)** මෙම කොටසින් විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා බාහිර තහවුරු කිරීම් කැඳවීම හැර වෙනත් විගණන ක්‍රියා පටිපාටි වර්ග තුනක් පැහැදිලි කරන ලෙස දක්වා තිබුනි. කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක තිබුනි. ප්‍රශ්නය පිළිබඳ දුර්වල අවබෝධය හේතුවෙන් ඇතැම් අයදුම්කරුවන් "බාහිර තහවුරු කිරීම් ඉල්ලා සිටීම" සඳහන් කර තිබුණි. බොහෝමයක් අයදුම්කරුවන් විගණන ක්‍රියා පටිපාටි සඳහන් කර ඇති නමුත් පැහැදිලි කර තිබුනේ නැත.

**(b)** මෙම කොටසින් 'සෘණාත්මක තහවුරු කිරීම් ඉල්ලීම' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කරන ලෙස ඉල්ලා තිබුනි. බොහෝ අසාර්ථක අයදුම්කරුවන් සෘණාත්මක තහවුරු කිරීමේ ඉල්ලීම් වෙනුවට බාහිර තහවුරු කිරීමේ අර්ථය පැහැදිලි කර තිබුණි. අපේක්ෂකයින් විසින් සපයනු ලබන වෙනත් අදාළ නොවන පිළිතුරු සමහරක් වන්නේ සවිස්තරාත්මක තොරතුරු නොමැතිව තහවුරු කිරීම, තහවුරු කිරීමේ පාර්ශවයට වගකීම් පියවා ගැනීමට නොහැකි අවස්ථාවන්හි ලබා දී ඇති තහවුරු කිරීම යනාදියයි.

**(c)** මෙම කොටසින් **T PLC** හි මූල්‍ය තොරතුරු හා සසඳන විට විගණකයාට සිදු කළ හැකි විශ්ලේෂණ ක්‍රියා පටිපාටි දෙකක් හඳුනා ගන්නා ලෙස ඉල්ලා සිටී. කාර්යසාධනය සාමාන්‍ය මට්ටමට වඩා අඩු මට්ටමක පැවතුනි. ඇතැම් අයදුම්කරුවන් සම්පූර්ණයෙන්ම අදාළ නොවන පිළිතුරු සපයා තිබුණි; අඛණ්ඩ පැවැත්ම පිළිබඳ විශ්ලේෂණය, පාලන පරීක්ෂණය, මූලික ක්‍රියා පටිපාටි යනාදිය.

**(d)** මෙම කොටසින් අසා සිටියේ අඛණ්ඩ පැවැත්ම උපකල්පනය සම්බන්ධයෙන් සැකයක් ඇතිකරන සිදුවීම් සහ තත්වයන් පහක් හඳුනා ගන්නා ලෙසයි. සියලුම අයදුම්කරුවන් පාහේ මෙම කොටස උත්සාහ කර ඇති අතර සතුටුදායක ලකුණු ලබා ගත්හ. ප්‍රශ්නයේ දක්වා ඇති විස්තර වලද අඛණ්ඩ පැවැත්ම උපකල්පනය පිළිබඳ බොහෝ කොන්දේසි සහ සිදුවීම් ඇතුළත් වේ. ස්ව-අධ්‍යයන පාඩම් මාලාව තුල ද අඛණ්ඩ පැවැත්ම උපකල්පනය හා සම්බන්ධ සිදුවීම් හා කොන්දේසි ගණනාවක් විස්තර කරයි.

**(e)** මෙම කොටසින් කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුලත් කිරීමේ අවශ්‍යතාවය සලකා බලමින් සමාගමේ ඉල්ලීම තක්සේරු කරන ලෙස ඉල්ලා සිටියේය. කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක් යනු කුමක්ද යන්න තේරුම් නොගෙන අයදුම්කරුවන් පිළිතුර ලබා දී ඇත. අයදුම්කරුවන්ගෙන් අඩු සංඛ්‍යාවක් පමණක් ප්‍රශ්නය උත්සාහ කළ අතර කාර්යසාධනය ඉතා දුර්වල විය. සමහර අයදුම්කරුවන් සඳහන් කර තිබුණේ විගණක විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය නුසුදුසු බව තහවුරු කල පසුත් කරුණක් අවධාරණය කිරීමේ ඡේදය දැක්විය හැකි බවයි. අයදුම්කරුවන් අතළොස්සක් ප්‍රකාශ කළේ තත්වාගණනය කළ මතයක් ලබා දිය යුතු බවයි.

**(f)** මෙම කොටසින් ඉල්ලා සිටියේ **T PLC** හි මූල්‍ය ප්‍රකාශන සඳහා තත්වාගණනය කළ මතයක් නිකුත් කිරීමේ යෝග්‍යතාවය හෝ යෝග්‍ය නොමැති බව පැහැදිලි කරන ලෙසටය. මෙම කොටස අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් විසින් උත්සාහ කරන ලද අතර කාර්යසාධනය ඉතා දුර්වල විය. සමහර අයදුම්කරුවන් සඳහන් කර තිබුණේ තත්වාගණනය කළ මතයක් නිකුත් කළ හැකි බවයි. උත්සාහ කළ බොහෝ අයදුම්කරුවන් සාවද්‍ය ප්‍රකාශයේ ප්‍රමාණාත්මක බව සඳහන් කළ නමුත් පුළුල් බව නොසලකා හරින ලදී. එමනිසා, අයදුම්කරුවන් ගෙන් අඩු සංඛ්‍යාවක් සඳහන් කළේ ප්‍රමාණාත්මක බව හා පුළුල්බව යන දෙකම තත්වාගණනයකට හේතු වන බැවින් අහිතකර මතයක් ලබා දිය යුතු බවයි.

පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුමක් ලබා ගැනීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ:

- අඛණ්ඩ පැවැත්ම සඳහා බලපාන මූල්‍ය හා මෙහෙයුම් දර්ශක.
- අඛණ්ඩ පැවැත්ම සඳහා කළමනාකරණ වගකීම.
- අඛණ්ඩ පැවැත්ම සමාලෝචන සඳහා විගණන ක්‍රියා පටිපාටි.
- විගණකාධිපති වාර්තාකරණය (වඩාත් වැදගත්)

\- - -

**<u>විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:</u>**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.
- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.
- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.
- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දෑ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් විභාගවල ප්‍රශ්නවලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.
- ප්‍රශ්න පත්‍ර වල පරීක්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසින් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මගින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.
- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙළ කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නගා ගැනීම සිදුකළ යුතුය.
- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.
- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.
- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.
- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට ඵලදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.
- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.
- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍ය කරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

- * * -